# ජ්‍යෙෂ්ඨ ද්විතියික ශ්‍රේණිවල ශිෂ්‍යයන්ට වෘත්තිය අධ්‍යාපනය ලබාදිමෙහි ලා තෙවන කාණ්ඩයේ තාක්ෂණික විෂයයන් ඉගැන්වීම තුළින් ඉටුවන කාර්යභාරය

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ අධ්‍යාපනපති උපාධියට අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කිරීම සඳහා ඉදිරිපත් කෙරෙන නිබන්ධනයකි.


පී.කේ.ජේ.එස්. කුලසේකර

2012

409080868



OPEN UNIVERSITY

70892

70892

# සංක්ෂිප්තය.

ජ්‍යෙෂ්ඨ ද්විතියික ශ්‍රේණිවල ඉගෙනුම ලබන ශිෂ්‍යයන් ඉලක්ක කරගෙන උගන්වනු ලබන තෙවන කාණ්ඩයේ තාක්ෂණික විෂයය පාසල් වෘත්තිය අධ්‍යාපනය ප්‍රායෝගිකව ක්‍රියාවට නැංවීමේ නවතම වැඩසටහන වේ. පාසල් වෘත්තිය අධ්‍යාපනය ප්‍රායෝගික තලයකට ගෙන එමින් වැඩ ලෝකය හා සම්බන්ධ විය හැකි දැනුම, ආකල්ප හා කුසලතා දරුවන් තුළ සංවර්ධනය කළ හැකි පසුබිමක් මෙහි විෂයය සන්ධාරය තුළ අන්තර්ගත වී ඇත. එසේ වුවද පාසල් අධ්‍යාපනය ක්ෂේත්‍රය තුළ මෙකී විෂයය උගන්වන ආකාරය හා ශිෂ්‍යයන් එම විෂයයන් හැදෑරීම් කරනු ලබන ආකාරය මත මෙම වැඩසටහනේ'හි ප්‍රායෝගිකත්වය හා ගුණාත්මක බව සුරැකේ ද යන්න ගැටලුවකි. මෙම ගැටලුව හා ඒ ආශ්‍රිත ප්‍රවණතාවන් හඳුනා ගනිමින් ඒ පිළිබඳ විශ්ලේෂණයක යෙදෙමින් එම වැඩසටහනේ'හි ගුණාත්මක බව හා ප්‍රායෝගිකත්වය වර්ධනය සඳහා අවශ්‍යය යෝජනා ඉදිරිපත් කිරීමේ අරමුණු සහිතව මෙම පර්යේෂණ අධ්‍යයනය දියත් කරන ලදි.

ඒ සඳහා ගාල්ල දිස්ත්‍රික්කයේ ඇල්පිටිය අධ්‍යාපන කලාපයේ ඇල්පිටිය අධ්‍යාපන කොට්ඨාසයේ තෝරාගත් පාසල් තුනක විදුහල්පතිවරුන් ගෙන්, ගුරු භවතුන්ගෙන් හා ශිෂ්‍යයන්ගෙන් ප්‍රශ්නාවලි හා සම්මුඛ සාකච්ඡා මගින් රැස්කර ගත් තොරතුරු හා දත්ත විශ්ලේෂණයට බඳුන් කරන ලදි. එම දත්ත විශ්ලේෂණයේදී වැදගත් කරුණු රැසක් අනාවරණය කරගත හැකි විය.

වැඩ ලෝකයට අවශ්‍යය දැනුම, කුසලතා, ආකල්ප ශිෂ්‍යයා තුළ සංවර්ධනය කිරීමේ අපේක්ෂා සහිතව දියත් කල වැඩසටහන් වුවද පාසල තුල එය ක්‍රියාත්මක වන ආකාරය අනුව එම වැඩසටහන අපේක්ෂා කළ මට්ටමේ ප්‍රතිඵල අත් නොකරන බව අධ්‍යයනය තුළින් හෙළිවිය. එසේම භෞතික සම්පත් සම්බන්ධ ගැටලු ද, කාල කළමණාකරණය සම්බන්ධයෙන් පවත්නා ගැටලු හේතුවෙන් පැන නගින දුෂ්කරතාද, ඉගැන්වීම සඳහා ප්‍රමාණවත් කාල ඡේද සංඛ්‍යාවක් නොමැතිවීම ද, තරඟකාරී විභාග ක්‍රමය තුළ වන ශිෂ්‍යය පීඩනය ද, සාම්ප්‍රදායික ගුරු භූමිකාවෙන් මිදීමේ දී ගුරු භවතුන් දක්වන අසාර්ථකත්වය ද මෙම වැඩසටහන තුළින් අපේක්ෂිත ප්‍රතිඵල නෙලා ගත නොහැකි වීම සඳහා හේතු වූ බාධාකාරී සාධක ලෙස හඳුනා ගැනුණි. එසේම එම දුර්වලතාව සඳහා ශිෂ්‍යයන්ගේ විෂයය තෝරා ගැනීම හා ගුරුභවතුන්ගේ ඉගැන්වීම් ක්‍රමවේදයන් වෙනස් කිරීම තුලින් විසඳුම් සෙවිය හැකි බව අනාවරණය විය.

විෂයය ක්ෂේත්‍ර තුල අන්තර්ගත කර ඇති සෞඛ්‍ය හා ශාරීරික අධ්‍යාපන විෂයය එම විෂයය ක්ෂේත්‍රය තුලින් ඉවත් කිරීම ත්, ප්‍රාදේශියව ක්‍රියාත්මක කළ හැකි විෂයයන් හා ශිෂ්‍යය වෘත්තිය අපේක්ෂණයන්ට ගැලපෙන විෂයයන් ක්ෂේත්‍රයට අන්තර්ගත කිරිම ත්, විෂයය තෝරා ගැනිමේ දී ශිෂ්‍යය වෘත්තිය අපේක්ෂණ හා ගැලපීම් කළ හැකි මාර්ගෝපදේශකත්වයක් ලබාදීම ත්, බාහිර සම්පත් පුද්ගලයන් හා ආයතන හා සම්බන්ධ කර ගැනිමත්, කණ්ඩායම් ක්‍රම, ගවේෂණ වැනි ඉගෙනුම් ක්‍රමවේද භාවිතයත්, පාසල් තුළ ඇති භෞතික සම්පත් හා පුහුණු ගුරුභවතුන් භුවමාරු කර ගැනිමට ඉඩ ප්‍රස්ථා විවර කර දිමත් ඊට විසඳුම් ලෙස ඉදිරිපත් කළ යෝජනා අතර ඇත.